**ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

**9 වැනි පාර්ලිමේන්තුව**

**“ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පෞද්ගලීකරණ කිරීමෙන්**

**ජාතික ආරක්ෂාවට වන බලපෑම්” පිළිබඳ වාර්තාව**

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ

කාරක සභාවේ සභාපති

ගරු සරත් වීරසේකර මහතා

2023 ජුනි මස 09 වැනි සිකුරාදා

**தேசிய பாதுகாப்புப் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**

**9 வது பாராளுமன்றம்**

**“டெலிகொம் நிறுவனத்தினைத் தனியார்மயமாக்குவதால் தேசிய பாதுகாப்பில் ஏற்படும் விளைவுகள்” மீதான அறிக்கை**

*குழுவின் தவிசாளர் கௌரவ சரத் வீரசேகர அவர்களால்*

*பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டது*

*2023 ஜூன் 09 வெள்ளிக்கிழமை*

Sectoral Oversight Committee on National Security

9th Parliament

Report on “The effects of the privatization of Sri Lanka Telecom

on National Security”

Presented to Parliament by

The Hon. Sarath Weerasekara

Chair of the Committee

Friday, 9th June 2023



ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

**9 වැනි පාර්ලිමේන්තුව**

**“ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පෞද්ගලීකරණ කිරීමෙන් ජාතික ආරක්ෂාවට වන බලපෑම්” පිළිබඳ වාර්තාව**

2023 ජුනි මස 09 වැනි සිකුරාදා

**ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

ගරු සරත් වීරසේකර මහතා (සභාපති)

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු සම්පත් අතුකෝරළ මහතා

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු මේජර් සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ 2023.04.04 දින පැවැති තෙවන රැස්වීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙහි සභාපති ඇතුළු උසස් නිලධාරීන් සහභාගී වූ අතර එදින සාකච්ඡා කළ කරුණු මත පදනම්ව ආංශික අධීක්ෂණ කාරක සභාවේ මතය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා මෙම වාර්තාව සකස් කර ඇත.

**කාරක සභාව සතු බලතල**

ආංශික අධීක්ෂණ කාරක සභාව සතු බලතල සහ ක්‍රියාකාරීත්වය පාර්ලිමේන්තුවේ අංක 111 දරන ස්ථාවර නියෝගය යටතේ දක්වා ඇති අතර වැඩි විස්තර පාර්ලිමේන්තු වෙබ් අඩවියෙහි ඇතුළත් කර ඇත. වෙබ් ලිපිනය:- www.parliament.lk

**ප්‍රකාශන**

ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පළ කරනු ලබන වාර්තාව පාර්ලිමේන්තු වෙබ් අඩවියෙන් (www.parliament.lk ) හෝ ආංශික අධීක්ෂණ කාරක සභා කාර්යාලය (කාරක සභා II කාර්යාලය) වෙතින් ලබා ගත හැකිය.

**ආංශික අධීක්ෂණ කාරක සභා කාර්යාලය**

හංස අබේරත්න මහතා - පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්
ජනකාන්ත සිල්වා මහතා - අධ්‍යක්ෂ, ව්‍යවස්ථාදායක සේවා
මොහොමඩ් මබ්රූක් මහතා - සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
චමිලා රූපසිංහ මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි

**යොමු කිරීම් සහ විමසීම්**

මෙම වාර්තාව සම්බන්ධයෙන් වූ සියලු ලිපිලේඛන සහ විමසීම් කාරක සභා ලේකම් අමතමින් ''ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, කාරක සභා කාර්යාලය II, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ'' යන ලිපිනය වෙත ලිපියක් යොමු කිරීමෙන් හෝ 011-2 777 100 යන දුරකථන අංකය ඇමතීමෙන් සිදු කළ හැකිය.

පටුන

1. හැඳින්වීම 4
2. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීමක් 5
3. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙහි කැපී පෙනෙන ලක්ෂණ 5
4. සයිබර් ආරක්ෂාව 6
5. ශ්‍රී ලංකා ටෙලිකොම් පෞද්ගලීකරණය කරනු ලැබුවහොත් ජාතික ආරක්ෂාවට වන බලපෑම 6
6. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙහි වගකීම් 9
7. BT සමූහයෙන් උගත හැකි පාඩම් 10
8. නිර්දේශ 10

## 1. හැඳින්වීම

i. ජාතික ආරක්ෂාවට ආහාර සුරක්ෂිතතාව, බලශක්ති සුරක්ෂිතතාව, සෞඛ්‍ය සුරක්ෂිතතාව, නීතියේ ආධිපත්‍යය, මහජනතාවගේ ආරක්ෂාව පිළිබඳ විශ්වාසය යනාදී සියලු අදාළ අංශ ප්‍රායෝගිකව ඇතුළත් වේ. ජාතික ආරක්ෂාව බොහෝ දුරට රඳා පවතින්නේ රටක කටයුතු සම්බන්ධයෙන් කෙතරම් පාලනයක් තිබේද, පරමාධිපත්‍යය සහ මව්බිමට අත්‍යවශ්‍ය වත්කම්වල කොපමණ පාලනයක් තිබේද යන්න යන්න මතය. එබැවින් ඉතා දුෂ්කර අවස්ථාවන්හිදී පවා, අප පාලනයකින් තොරව අපගේ වටිනා සහ වැදගත් වත්කම් විකුණා දැමුවහොත්, අපගේ ස්වෛරීත්වයට බලපාන සම්පූර්ණ පාලනය අපට අහිමි වේ.

ii ණය, ආධාර, පරිත්‍යාග යනාදිය ලබා දීමෙන් සහ ප්‍රධාන ආයෝජන සඳහා කැපවීමෙන් වෙනත් රටක් පාලනය කිරීමට රටවල් බොහෝ “උපක්‍රම” භාවිතා කරයි. එබැවින් සුප්‍රසිද්ධ කියමන “ග්‍රීකයින් තෑගි දෙන විට, පරෙස්සම් වන්න”. තවත් සමහරක් “රෙජීම් චේන්ජ්” සඳහා කුමන්ත්‍රණය කර වෙනත් රටක් පාලනය කිරීමට උත්සාහ කරති. එබැවින් ජාතික ආරක්ෂාව සහතික කිරීම සඳහා ස්වෛරීභාවය/ස්වාධීනත්වය ඉතා වැදගත් අංගයකි. අපගේ වැදගත් වත්කම් සම්පූර්ණයෙන්ම 'පිටස්තරයින්' විසින් පාලනය කරන්නේ නම්, අපි ඉතා 'අවදානමට' ලක් වීමට නැඹුරු වන අතර අපගේ පරමාධිපත්‍යය ද එම ක්‍රියාවලියේදී පීඩාවට පත්වනු ඇත.

iii. පසුගියදා බණ්ඩාරනායක ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රික පුහුණු ආයතනයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී අග්‍රාමාත්‍යවරයාගේ අදහස් දැක්වීමෙන් උපුටා ගත් ආකාරයට “ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය "මධ්‍යස්ථභාවය" මත පදනම් වන අතර අපි සෑම රටකටම මිත්‍රත්වයේ හස්තයක් දිගු කරමු. නමුත් මෙම මධ්‍යස්ථභාවය දුර්වලතාවයක් ලෙස නොගත යුතුය. එය කලාපීය ජාත්‍යන්තර බල ක්‍රීඩා වලින් හුදෙක් වෙන් වූ මධ්‍යස්ථභාවයකි. මධ්‍යස්ථ වුවත්, තුන්වන රටකට එරෙහිව අපේ භූමිය භාවිතා කිරීමට අපි කිසිවෙකුට ඉඩ නොදෙමු. එවැනි උත්සාහයන් වලදී අපි අපගේ ස්වෛරීභාවය ජ්වලිතව ආරක්ෂා කරමු.”

iv. "උදාසීන ප්‍රතිපත්තියක්" විශ්වාස කළ හැකි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම යනු ස්වාධීනව ක්‍රියා කිරීමේ හැකියාවයි. එම නිදහස ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් ස්වාධීන විය යුතුය. ජාතික ආරක්ෂාව නොමැතිව ආර්ථික ස්වාධීනත්වය ලබා ගත නොහැක. එබැවින් වත්කම් විකිණීමේදී, ජාතික ආරක්ෂාව ඉහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා එවැනි වත්කම් තීරණාත්මක වේද යන්න අප සලකා බැලිය යුතුය.

v. අපි වසර 30කට වැඩි කාලයක් කොටි (දෙමළ ඊළාම් විමුක්ති කොටි) ත්‍රස්තවාදීන්ට එරෙහි යුද්ධයකට මුහුණ දී ඇත්තෙමු. අපි එල්ටීටීඊය සම්පූර්ණයෙන් පරාජය කළත්, තවමත් බෙදුම්වාදී දෙමළ ඩයස්පෝරාව සහ කොටි හිතවාදී අරමුදල් සපයන ආයතන / එල්ටීටීඊයට සහාය දුන් පුද්ගලයින් විශාල වශයෙන් නිදැල්ලේ වාසය කරති. දශක 3ක් තිස්සේ ත්‍රස්තවාදය මුදාහැරීමෙන් ත්‍රස්තවාදීන්ට ඉටුකර ගැනීමට නොහැකි වූ එල්ටීටීඊයේ අරමුණ වෙනත් ක්‍රම මගින් ඉටුකර ගැනීමට ඔවුහු උත්සාහ කරති.

vii. ත්‍රස්තවාදය තුළ "මධ්‍යස්ථ මිනිසෙක්" නැත. එක්කෝ ඔබ ත්‍රස්තවාදියෙක් හෝ ඔබ ත්‍රස්තවාදියෙක් නොවේ. එහෙයින් එල්.ටී.ටී.ඊ.යට දුරස්ථව හෝ උදව් කළ ඕනෑම අයෙක් ත්‍රස්තවාදියෙකි. එවැනි පුද්ගලයන්ට/ආයතනවලට/කණ්ඩායම්වලට/සංවිධානවලට අපගේ ජාතික වත්කම් සම්බන්ධයෙන් කිසිදු පාලනයක් ඇතිකර ගැනීමට ඉඩ නොතැබිය යුතු අතර කිසිදු කොටස් මිලදී ගැනීමට ඉඩ නොතැබිය යුතුය. ජාතික ආරක්ෂාව සාක්ෂාත් කර ගත හැක්කේ එවැනි එඩිතර තීරණවලින් පමණයි.

viii. වැදගත් තොරතුරු සඳහා ප්‍රවේශය ජාතික ආරක්ෂාවේ ප්‍රධාන අංගයකි. ශ්‍රී ලංකා ටෙලිකොම් යනු රටේ ජාතික විදුලි සංදේශ සේවා සපයන්නා වේ. එබැවින් එවැනි වත්කමක් සම්පූර්ණයෙන්ම පෞද්ගලීකරණය කිරීමට පෙර එය පිටස්තරයින් විසින් පාලනය කරන්නේ නම් රටේ ජාතික ආරක්ෂාව සම්මුතියකට ලක්වේද යන්න අප විමසා බැලිය යුතුය.

**2. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීමක්**

i. ශ්‍රී ලංකා ටෙලිකොම් (SLT) යනු ජාතික තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) විසඳුම් සපයන්නා වන අතර Broadband සහ Backbone යටිතල පහසුකම් සපයන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයතනය වේ.

ii. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ගාල්ල සිට කොළඹ අතර පළමු විදුලි පණිවිඩ පරිපථය ස්ථාපිත කරමින් 1858 දී තම මෙහෙයුම් ආරම්භ කර තිබේ. 1994 දී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය අර්ධ වශයෙන් පෞද්ගලීකරණයට ලක් කළ අතර 35% ක කොටස් ප්‍රමාණයක් ජපාන විදුලි සංදේශ සහ දුරකථන සමාගමක් වන නිපොන් ටෙලිග්‍රාෆ් සහ ටෙලිෆෝන් සමාගම වෙත අලෙවි කරන ලදී. 2008 දී නිපොන් ටෙලිග්‍රාෆ් සහ ටෙලිෆෝන් සමාගම තම කොටස් ප්‍රමාණය ග්ලෝබල් ටෙලිකොමියුනිකේෂන් හෝල්ඩින්ග්ස් නැමැති නෙදර්ලන්ත සමාගමකට අලෙවි කරන ලද අතර එය Usaha Tegas Sdn Bhd නැමැති මැලේසියන් සමාගමට පූර්ණ වශයෙන් අයත් අනුබද්ධිත සමාගමකි. අද වන විට මැලේසියානු සමාගමට කොටස් 44.98% ක් සහ ආණ්ඩුවට 49. 50% ක් අයත් වේ.

**3. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කැපී පෙනෙන ලක්ෂණ**

I. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය එහි අධිවේගී ෆයිබර්, කොපර් සහ රැහැන් රහිත ප්‍රවේශ ජාලය හරහා දිවයිනේ මිලියන නවයකට අධික පාරිභෝගිකයන් සඳහා වන අවශ්‍යතා සපුරාලයි.

Ii. බහුවිධ ජාත්‍යන්තර සබ්මැරීන් රැහැන් ජාල උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකා ටෙලිකොම් ලෝකය හා සම්බන්ධ වී ගෝලීය සේවාවක් සපයයි.

Iii. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ස්ථාවර සහ ජංගම දුරකථන, බ්‍රෝඩ්බෑන්ඩ්, ඩේටා සේවාවන්, අන්තර්ජාල ප්‍රොටෝකෝල් රූපවාහිනී, cloud computing සහ සත්කාරක සේවා ආදිය ආවරණය කරයි.

iv. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ මූලික ක්‍රමෝපායික අංග වන්නේ ආදායමින් 98% ක් පමණ වන ප්‍රධාන ව්‍යාපාර අඩංගු වන ස්ථාවර තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම් සහ ජංගම තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම් වේ.

v. ස්ථාවර තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම්තුළින් සියලුම ආර්ථික අංශවලට, රාජ්‍ය අංශයේ ආයතන සහ ගෘහස්ථ පාරිභෝගිකයන්ට ශ්‍රී ලංකා ටෙලිකොම් විසි න් තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවා සපයයි.

vi. ශ්‍රී ලංකා ටෙලිකොම් තාක්ෂණයට ඔප්ටිකල් ෆයිබර් ADSL 2+, VDSL 2, Carrier – Grade, WiFi සහ ස්ථාවර සහ ජංගම 4G LTE තාක්ෂණය අයත් වේ.

vii. මොබිටෙල් මගින් ජංගම දුරකථන සේවා, ජංගම මුදල් (M cash) සපයයි.

viii. මොබිටෙල් විසින් පළමු 5G කලාපය "වන් ගෝල්ෆේස්හි" විවෘත කර තිබේ. එම සමාගම විසින් මේ සම්බන්ධයෙන් වැඩිදුර සංවර්ධන කටයුතු සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 700 කට වැඩි ප්‍රමාණයක් ආයෝජනය කර තිබේ.

ix. ශ්‍රී ලංකා ටෙලිකොම්හි පුළුල් ෆයිබර් ඔප්ටික් ජාලය තත්පරයකට ගිගා බයිට් 1 Broadband වේගයක් සහිතව රට පුරා කිලෝ මීටර් 60,000කට ආසන්න ප්‍රමාණයක පැතිරී තිබේ.

x. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ආදායම 2022 වසරේ රුපියල් බිලියන 108 ක් වූ අතර එහි ලාභය රුපියල් බිලියන 8.46 කි.

**4. සයිබර් ආරක්ෂාව**

i. සමාජයන්හි වේගවත් ඩිජිටල් පරිවර්තනය, ජාතීන් ක්‍රියාත්මක වන ආකාරය සහ ඔවුන්ගේ කටයුතු සිදු කරන ආකාරය විප්ලවීය වෙනසකට බඳුන් කර ඇත. ජාතීන් ඩිජිටල් තාක්ෂණ හා විසඳුම් මත රඳා පවතින අතර එබැවින් සයිබර් ආරක්ෂාව ජාතික ආරක්ෂාවේ අත්හළ නොහැකි සංරචකයක් බවට පත්ව තිබේ. එසේ හෙයින් ජාතියක තීරණාත්මක යටිතල පහසුකම්, ආරක්ෂක පද්ධති සහ එහි පුරවැසියන්ගේ පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීම අතිශයින්ම වැදගත් වී ඇත.

ii. දිවයින/ලෝකය පුරා තොරතුරු හුවමාරුවට හැකියාව ලබා දෙමින් විදුලි සංදේශ අංශය සන්නිවේදන ජාලයේ කොඳු නාරටිය ලෙස ක්‍රියා කරයි. අනවසර ප්‍රවේශය, දත්ත උල්ලංඝනය කිරීම් සහ සන්නිවේදන තුළ බාධා වැළැක්වීම පිණිස මෙම ජාල සුරක්ෂිත කිරීම තීරණාත්මකය. සංවේදී තොරතුරු සහ බුද්ධි තොරතුරු ආරක්ෂා කරනු ලැබිය යුතු අතර අනවසර ප්‍රවේශය වැළැක්වීම සඳහා රාජ්‍යය විසින් පමණක් පරිහරණය කරනු ලැබිය යුතුය.

iii. එල්.ටී.ටී.ඊ. ජාත්‍යන්තර ජාලය එහි ඊනියා "දෙමළ ඊළාම් සයිබර් බලකාය" යටතේ දැනටමත් ශ්‍රී ලංකාවේ සයිබර් අවකාශයට බහු විධ ප්‍රහාර දියත් කර තිබේ.

**5. ටෙලිකොම් ආයතනය පෞද්ගලීකරණය කරනු ලැබුවහොත් ජාතික ආරක්ෂාවට වන බලපෑම**

i. රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල, ඉහළ මට්ටමේ රාජ්‍ය අංශය, පුද්ගලික අංශයේ සහයෝගිතා ව්‍යාපාර, ආරක්ෂක සේවා, පොලිසිය වැනි ආයතනවලට ශ්‍රී ලංකා ටෙලිකොම් ස්ථාවර රැහැන් සම්බන්ධතා සපයයි. වැදගත් ග්‍රාහකයන්ගේ තොරතුරු කාන්දු වීමේ හෝ හොර රහසේ තොරතුරු සොයන්නන් ඒවා ලබා ගැනීමේ ඉහළ අවදානමක් ඇති වනු ඇත. හඬ සහ දත්ත දේශීයව සහ විදේශීය යන දෙආකාරයෙන්ම තෙවන පාර්ශ්වයක් වෙත යවනු ලැබීමට හැකියාව ඇත.

ii. ශ්‍රී ලංකා ටෙලිකොම් ජාල ස්ථලකය සැලසුම් කරනු ලැබ ඇත්තේ ජාල අංග විශාල සංඛ්‍යාවක් දිවයින මුළුල්ලේ ඇඳහැලෙන ආකාරයටය. දැනට තිබෙන නවීනතම තාක්ෂණය සමඟ, ජාල අංග බොහොමයක් සැලසුම් කරනු ලැබ ඇත්තේ ඇමතුම් පතුරුවා හැරීමට හා හොර රහසේ තොරතුරු සෙවීමට හැකියාව ලබා දෙමිනි. පෞද්ගලිකකරණය කරනු ලැබුවහොත් රජයට පාලනය අහිමි වනු ඇති අතර කුමන ග්‍රාහකයන්ට රහසේ සවන් දෙනු ලබන්නේ ද සහ නිරීක්ෂණය කරනු ලබන්නේ ද යන්න වටහා ගැනීම කළ නොහැකිවනු ඇත.(එබඳු නිරීක්ෂණය කිරීම් සඳහා භාවිතා කෙරෙන බොහොමයක් මෘදුකාංග සහ මෙවලම් සාමාන්‍ය මෙහෙයුම් සහ නඩත්තු වලින් සහ ජාල විගණන වලින් සැඟවී පවතී.)

iii. අතිශයින්ම වැදගත් පුද්ගලයන්ගේ සහ ආරක්ෂක නියෝජිත ආයතනවල ඇමතුම් විස්තර වාර්තා බිල්පත් සැකසීමේ හා යැවීමේ පද්ධති/ජාල අංග වෙතින් පහසුවෙන්ම ලබා ගැනීමේ සහ ඒවා වැරදි පුද්ගලයන් අතට පත් වීමේ හැකියාව තිබේ. අන්තර්ජාලය තුළ, භාවිතා කරන්නා නිතරම බලන අඩවි වටහා ගැනීම සඳහා පිරික්සුම් (browsing) දත්ත බොහොමයක් උකහාගෙන ඒවා නැවත ගොඩ නැගීමේ හැකියාව පවතී.

iv. ජංගම ජාලය තුළ, භාවිතා කරන්නාගේ දැන ගැනීමෙන් තොරව පුද්ගලික මෙහෙයුම්කරුට පහත දැක්වෙන දේ කළ හැකිය.

- භූගෝලීය සීමා පැනවීම (යම් ප්‍රදේශවලට අවසරය දීම හෝ නොදීම)

• සිම් කාඩ් පත භාවිතා කරන්නා සිටින ස්ථානය දැන ගැනීම

• මාර්ගය පිළිබඳව විමසිලිමත්ව සිටීම

• පිරික්සුම් (browsing) දත්ත ලබාගැනීම

• MDM මෘදුකාංගය භාවිතා කරමින් දුරස්ථව ජංගම උපකරණයක් ක්‍රියා විරහිත කිරීම

ඉහත ලැයිස්තුගත කර ඇත්තේ අවදානම් සාධක ගණනාවක් අතරින් කිහිපයකි.

v. ජාතික ආරක්ෂාව යනු හමුදා ප්‍රහාරයකින් ආරක්ෂාවීම පමණක් නොව ආර්ථික ආරක්ෂාව, බලශක්ති ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව යනාදිය ද විශේෂයෙන්ම සයිබර් ආරක්ෂාව ද ඇතුලත් වේ. එබැවින් ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරු, රාජ්‍ය නොවන අංශ වෙත පහසුවෙන් පත්වීම වළක්වා ගැනීම ආණ්ඩුවේ වගකීමයි.

vi. විදුලි සංදේශ සේවා බ්‍රෝඩ්බෑන්ඩ් (අන්තර්ජාල) ආදියට කිසියම් හෝ බාධාවක් ඇතිවීම බැංකු, විදුලිබල, සෞඛ්‍ය, ඛනිජ තෙල් ආදී ක්ෂේත්‍ර පූර්ණ හෝ අර්ධ අකර්මන්‍යතාවයට පත් කළ හැකි බැවින් සෑම ව්‍යාපාරයකටම/ ආයතනයකටම යම් ආකාරයක සම්බන්ධතාවයක් සහිත එම සේවාවන් බාධාවකින්/ කඩාකප්පල් කිරීමකින් තොරව තිරසර ආකාරයෙන් පවත්වා ගෙන යා යුතුය.

vii. ශ්‍රී ලංකා ටෙලිකොම්හි තීරණාත්මක ලෙස වැදගත් ජාතික යටිතල පහසුකම් වන්නේ දත්ත මධ්‍යස්ථාන, සබ්මැරීන් රැහැන් ගොඩබෑම් ස්ථාන, ජාලයන්හි විහිදුම් ස්ථාන, සන්නිවේදන කුලුණු, ඉංජිනේරු කාමර සහ යන්ත්‍රෝපකරණ ය. රජය විසින් මෙම යටිතල පහසුකම්වල ආරක්ෂාව තහවුරු කළ යුතු අතර පෞද්ගලික සමාගම්වල පාලනය යටතේ ඇති විට ඒවායේ ආරක්ෂාව පිළිබඳ සහතිකයක් ලබා දිය නොහැක.

viii.විදුලි සංදේශ පද්ධතියට එල්ල වන සාර්ථක සයිබර් ප්‍රහාරයකට ජාතික ආරක්ෂාව බරපතල අනතුරකට ලක් කරමින් දුරකථන භාවිතා කරන්නන් දහස් ගණනකගේ සේවා අඩාල කිරීම, ගණුදෙනුකරුවන් දස ලක්ෂ ගණනකට අන්තර්ජාල පහසුකම් අහිමි කිරීම, ව්‍යාපාර අකර්මන්‍ය කිරීම මෙන්ම රජයේ මෙහෙයුම් වසා දැමීම කළ හැකිය.

ix. ෆයර්වෝල්, ඉලෙක්ට්‍රොනික ආවේක්ෂණ, ප්‍රවේශ පාලන උපකරණ ආදිය ස්ථාපිත කිරීම මගින් ඉහත සඳහන් කල ආකාරයේ සයිබර් ප්‍රහාර මැඩපැවැත්වීම සඳහා වූ ක්‍රමවේද ශ්‍රී ලංකා ටෙලිකොම් විසින් තහවුරු කල යුතුය. ජාතික ආරක්ෂාව සිය ප්‍රමුඛතාවය නොවන බැවින් ඉහත අවශ්‍යතා සඳහා මුදල් වැය කිරීම පෞද්ගලික සමාගම් විසින් සිදු නොකරනු ඇත. එබැවින් පෞද්ගලීකරණය විසින් සයිබර් තර්ජනයන් ඇතිවීමට ඇති අවදානම ඉහළ දමනු ඇත. ස්වකීය හවුල්කරුවන් වෙනුවෙන් ලාභ උපරිමකරණය කිරීමට පෞද්ගලික සමාගම් හට නෛතික බැඳීමක් ඇති අතර ඔවුන් මහජන යහපත වෙනුවෙන් කටයුතු නොකරනු ඇත. පෞද්ගලික සමාගමක මෙහෙයුම් සම්බන්ධයෙන් මහජනතාවට ඇති අධීක්ෂණ බලය ඉතා සීමිත (ඇතැම්විට කිසිසේත්ම නොමැති) වන අතර ඒ අනුව එම සමාගම් විසින් සිදු කරනු ලබන කවර හෝ වැරදි සම්බන්ධයෙන් ඒවා වගවීමකට ලක් කිරීම අපහසුය.

x.රජයේ සහ ආරක්ෂක අංශවල සියලු වෙබ් අඩවි පවත්වා ගෙන යනු ලබන්නේ ශ්‍රී ලංකා ටෙලිකොම් හරහා වන අතර ඒ හේතුවෙන් ඒ සඳහා රජයේ වියදම පෞද්ගලික සමාගමකින් එම සේවාවන් ලබා ගැනීමේදී දැරිය යුතු වියදමට සාපේක්ෂව අවමය.

xi. ශ්‍රී ලංකා ටෙලිකොම් යනු රටේ පැරණිතම විදුලි සංදේශ සේවා සපයන්නා වන අතර ඊට දශක ගණනාවක් පුරා විහිදුනු දත්ත පද්ධතියක් ඇත. එය පෞද්ගලීකරණය කලහොත් එකී සියලු දත්ත පෞද්ගලික සමාගම් වලට විවෘත වනු ඇත.

xii. ශ්‍රී ලංකාවේ විශාලතම ග්‍රාහක පද්ධතිය ශ්‍රී ලංකා ටෙලිකොම් සතුවේ. මේ වන විට එහි ප්‍රධානතම පාර්ශවකරු වන්නේ රජයයි. සාමාන්‍යයෙන් රජයට ආදායම උපයා ගැනීමට සහ රාජ්‍යය මත ඇති මූල්‍ය බර අවම කර ගැනීම සඳහා වත්කම් පෞද්ගලීකරණය කරනු ලබයි. පෞද්ගලික සමාගම් බොහෝ විට ලාභ කේන්ද්‍ර කොට ගනිමින් කටයුතු කරන බැවින් පෞද්ගලීකරණය විසින් ඵලදායීතාවය ඉහළ දමයි.

ශ්‍රී ලංකා ටෙලිකොම් පෞද්ගලීකරණය කළහොත් එහි බහුතර කොටස්වල අයිතිය සහ පාලනය පෞද්ගලික ආයෝජකයින් සතු වන අතර ඔවුන් විසින් සිය ලාභයට පෙර රටේ අවශ්‍යතාවට ප්‍රමුඛත්වය ලබා දීම සිදු නොකරනු ඇත.

xiii. වර්තමානයේ පවතින සයිබර් තර්ජන සහ රහස් ඔත්තු බැලීම් හමුවේ සන්නිවේදන පද්ධතිවල ආරක්ෂාව සහ දත්ත ආරක්ෂා කිරීම බෙහෙවින් වැදගත් කරුණක් බවට පත්ව ඇත. රජයේ ආයතන හා සමාන මට්ටමේ වගවීමක් සහ අධීක්ෂණයක් පෞද්ගලික සමාගම් සතු නොවිය හැකි බැවින් ශ්‍රී ලංකා ටෙලිකොම් පෞද්ගලීකරණය කිරීම හරහා එවන් සංවේදී තොරතුරු කාන්දු වී ආරක්ෂක අවදානම් ඇති කළ හැකිය. ඔවුන් විසින් රටේ දත්ත වල අරක්ෂාවට ඔබ්බෙන් “වියදම් අඩු කොට ලාභය උපරිමකරණය කිරීම” හේතුවෙන් ද්වේශ සහගත පාර්ශවයන්හට අවදානමේ වාසිය ලබා ගනිමින් සංවේදී තොරතුරු වෙත ප්‍රවේශය ලබා ගත හැකිය. අවදානමට ලක්වන ශ්‍රී ලංකා ටෙලිකොම් කඩාකප්පල් කිරීම් සහ කාන්දු වීම් වලට පහසුවෙන් භාජනය වනු ඇත.

xiv.යුද්ධ / හදිසි අවස්ථා තත්ත්වයන් තුල විවිධ ආයතන සමග සන්නිවේදනය සිදු කිරීම සඳහා රටක් විසින් විදුලි සංදේශ සේවාවන් මත විශ්වාසය තබයි. තීරණාත්මක ලෙස වැදගත් සන්නිවේදන ජාලයන් පෞද්ගලික සමාගම් සතු වන්නේ නම් ජාතික ආරක්ෂක සහ රාජ්‍ය ආරක්ෂක මෙහෙයුම් අනතුරට ලක්වන හෝ ඒ තුල ප්‍රමාදයන් ඇති වන තත්ත්වයන් නිර්මාණය වී එමගින් බරපතල ප්‍රතිවිපාක ඇති විය හැකිය. එබැවින් ඒ සම්බන්ධයෙන් කවර හෝ තීරණයක් ගැනීමට මත්තෙන් ජාතික ආරක්ෂාවට සිදුවිය හැකි බලපෑම ආදී ශ්‍රී ලංකා ටෙලිකොම් පෞද්ගලීකරණය කිරීම හරහා ඇති විය හැකි දීර්ඝ කාලීන බලපෑම් සලකා බලා පෞද්ගලීකරණයෙන් අත්වන වාසි සමග ඒවා සැසඳීම අත්‍යවශ්‍යය.

xv. රවුටර අයථා අයුරින් භාවිතා කිරීම, ඇමතුම් වෙනත් තැන් වලට විතැන් කිරීම, දුරකථන අංක හා ඇමතුම් පැහැර ගැනීම වැනි ටෙලිකොම් කර්මාන්තය තුළ පවත්නා වංචාකාරී ක්‍රියාවන් හේතුවෙන් රජයට සැලකිය යුතු ආදායම් ප්‍රමාණයක් අහිමි විය හැකිය. පූර්ණ වශයෙන් පෞද්ගලීකරණයට ලක් වූ විට ටෙලිකොම් වැනි පෞද්ගලික සමාගම් වලට එවන් කටයුතු කෙරෙහි යොමුවී නිවැරදි බදු ගෙවීමද පැහැර හරිමින්, ආයතනයේ නිත්‍යානුකූල ව්‍යාපාර කටයුතු වලින් බැහැරව වෙනත් ආදායම් ඉපදවිය හැකිය.

xvi. “2022 අංක 9 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත” වැනි ටෙලිකොම් කළමනාකාරිත්වයේ ව්‍යවස්ථාපිත වගකීම් පවතින අතර ඒ තුලින් අන්තර්ජාලය ඔස්සේ සිදුවන ගනුදෙනුවලදී තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා වීම පිළිබඳ පාරිභෝගික විශ්වාසය සහතික කරනු ලැබේ.

අනෙකුත් නීති වන්නේ,

- 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත
- 2006 අංක 19 දරණ විද්‍යුත් ගනුදෙනු පනත
- 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත
- 1988 අංක 30 දරණ බැංකු පනත
- 1991 අංක 25 දරණ විදුලි සංදේශ පනත
- 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත

පෞද්ගලිකරණය කරනු ලැබුයේ නම් සහ ශ්‍රී ලංකා ටෙලිකොම්හි කොටස් පාලනය කරනු ලබන ගැනුම්කරු විසින් ඉහත පනත් වලට අනුකූලව කටයුතු කිරීමට එකඟ නොවන්නේ නම් අනිවාර්යයෙන්ම ජාතික ආරක්ෂාව කෙරෙහි බලපෑමක් ඇති වේ.

xvii. ආයෝජනය කරනු ලබන සියලු පාර්ශ්වයන් විසින් අත්සන් කරනු ලබන C&MA එකඟතාවය මගින් මේ එක් එක් සබ්මැරීන කේබල පද්ධතිය පාලනයට ලක් වන අතර, “එහි ඇති සියලු සිතියම් සහ

තොරතුරු ආදිය ''රහසිගත'' වශයෙන් අර්ථ නිරූපනය කෙරේ. මෙම ආයතන සමූහයේ කළමනාකරණ කමිටුවෙන් අවසරය ලබා ගැනීමකින් තොරව ඒවා තුන්වන පාර්ශ්වයක් වෙත අනාවරණය කළ නොහැකිය. පෞද්ගලිකරණය කිරීමක් සිදු කරනු ලබන්නේ නම්, රජයට මෙහි පාලනය අහිමි වී යයි.

xviii. යුද්ධයේ අවසාන අදියරේදී (2007-2009) සන්නද්ධ හමුදාවන් රේඩියෝ සන්නිවේදනයට වඩා CDMA සහ චන්ද්‍රිකා සන්නිවේදනය මත විශාල වශයෙන් පදනම්ව කටයුතු කරන ලදී. හමුදාවේ රේඩියෝ සන්නිවේදන අවහිර කිරීමට සහ ඒවාට බාධා කිරීමට එල්ටීටීඊ සංවිධානය විසින් උත්සාහ දරන ලද අතර මූලස්ථානවල සිට හමුදා හට කාණ්ඩ මට්ටම දක්වා භාවිතා කරන ලද CDMA ක්‍රමය මෙයට පිළිතුර විය. ඝන වනාන්තර තුලට පිවිසි දීර්ඝ මුර කණ්ඩායම් විසින් චන්ද්‍රිකා සන්නිවේදනය භාවිතා කරන ලදී. මේ දෙවර්ගයම මූලිකවම සපයන ලද්දේ ටෙලිකොම් සහ මොබිටෙල් සමාගම් විසිනි. පෞද්ගලිකරණය කරනු ලබන්නේ නම් ඒවා රජයේ හිමිකාරීත්වයක් සහිත ටෙලිකොම් පරිද්දෙන් සහයෝගය දැක්වීමක් සිදු නොකරනු ඇත.

xix. ටෙලිකොම් ක්ෂේත්‍රය යනු ස්වභාවයෙන්ම ඉතා ක්‍රියාශීලී ක්ෂේත්‍රයක් වන බැවින්, අඛණ්ඩ වැඩි දියුණු කිරීම් සහ වඩා දියුණු තත්ත්වයන් අපේක්ෂා කරනු ලැබේ. නවීකරණ ක්‍රියාවලිය සඳහා අරමුදල් අවශ්‍ය වන අතර ශ්‍රී ලංකාවේ ටෙලිකොම්හි පෞද්ගලික හිමිකරුවකු විසින්, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය ධනාත්මක එකක් වශයෙන් පෙනී යන්නේ නම් හැර, ලොව පුරා සිටින අනෙකුත් ටෙලිකොම් සේවා සපයන්නන් හා සමානවම අරමුදල් සැපයීමක් සිදු නොකරනු ඇත. ඒ අනුව සමාගමේ කළමනාකාරිත්වය විසින් බාහිර සේවා සපයා ගනිමින් ජාලය තුළට බොහෝ පාර්ශ්වකරුවන් ප්‍රමාණයක් සම්බන්ධ කර ගත හැකි අතර එමගින් දත්ත හෙළිදරව් වීමේ අවදානම ඉහළ යාම සිදු වේ.

xx. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මිල දී ගනු ලබන විදේශ සමාගමේ කළමනාකාරිත්වය එම සමාගම අයත් රටෙහි දේශපාලන ප්‍රතිපත්ති කෙරෙහි ස්වාභාවිකවම නැඹුරු වී පැවතිය හැකි ය. ශ්‍රී ලංකාව ඉතා වැදගත් ක්‍රමෝපායික භූගෝලීය පිහිටීමක තිබෙන අතර කලාපය තුළ සුපිරි බලවතුන්ගේ ප්‍රතිවිරෝධතාවයන් පවතී. ඉතා වැදගත් අංශයක් වන තොරතුරු සහ සන්නිවේදන අංශයෙහි පූර්ණ පාලනය විදේශීය සමාගමක් යටතට පත් කිරීම තුළින් සියලු රාජතාන්ත්‍රික දූත මෙහෙවර, රාජ්‍ය අංශයේ ඉහළ මට්ටමේ තීරණ ගන්නා මණ්ඩල, පෞද්ගලික අංශයේ සාමූහික ව්‍යාපාර සහ පොලීසිය, යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව යනාදිය වැනි ආරක්ෂක ආයතන ද දත්ත හෙළිදරව් වීමේ දැඩි අවදානමකට ගෙන යනු ඇත. රටෙහි ටෙලිකොම් සේවා සපයන්නා ඔස්සේ කවර හෝ ආකාරයක එවන් දත්ත පිළිබඳ කාරණා උල්ලංඝනය වීමක් සිදු වුවහොත් ශ්‍රී ලංකාවට අනවශ්‍ය රාජතාන්ත්‍රික ආරවුල් වලට මැදිවීමට සිදු විය හැකිය.

## 6. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙහි වගකීම්

(i) SEA-ME-WE සබ්මැරීන් කේබල් ආයතන සමූහයේ අනෙකුත් ගෝලීය හවුල්කරුවන් අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයද පාර්ශ්වකරුවකු වන අතර මෙම සමූහය කේබල පහක් ගොඩ නගා, හයවැන්න නිර්මාණය කිරීමෙහි යෙදී සිටී. SEA-ME-WE 6 වැනි කේබලය තුලින් ප්‍රංශයේ සිට සිංගප්පූරුව දක්වා වන රටවල් 19ක් මාතර ඇතුළු භූමි මධ්‍යස්ථාන 19ක් ඔස්සේ සම්බන්ධ කරනු ලැබේ. SEA-ME-WE 3 සහ 4 යන අනෙකුත් මෙහෙයුම් කේබල ගල්කිස්ස සහ කොළඹ සමග සම්බන්ධ වී පවතී. ගෝලීය ජාලයේ 99%ක්ම සබ්මැරීන කේබල ඔස්සේ ක්‍රියාත්මක වේ. එවන් කේබල හරහා ගලා යනු ලබන දත්ත ඉතා විශාල ප්‍රමාණයක් පවතින බැවින් ඕනෑම තත්ත්වයක් යටතේ එම කේබල ආරක්ෂා කිරීම සිදු කළ යුතු වේ. දේශීය වශයෙන් එම කේබල භූමිය හා සම්බන්ධ වන ස්ථාන ආරක්ෂා කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම්හි වගකීම වේ.

ii ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල්හි දත්ත මධ්‍යස්ථාන වැලිකඩ, පිටිපන ජාතික දත්ත මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇත. පිටිපන ජාතික දත්ත මධ්‍යස්ථානය හරිත ගොඩනැඟිල්ලක් ලෙස සහතික කර ඇති අතර Uptime Tier III සහතිකය ලබා ඇත. දත්ත මධ්‍යස්ථාන සහ වලාකුළු වේදිකාවන්හි විශාල පරිගණක දත්ත ධාරිතා සහ ජාල ධාරිතාවන් ඇති අතර රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ තීරණාත්මක සහ වැදගත් ව්‍යාපාරික ගනුදෙනුකරුවන්ට සේවය සැපයීමේදී එහි ධාරිතාව අතිමහත්ය. මෙම දත්ත මධ්‍යස්ථානවල පාරිභෝගික අංශවලට රාජ්‍ය ආයතන, ජාත්‍යන්තර ආයතන,

විශාල ව්‍යවසායන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුළත් වේ. සත්කාරක විසඳුම් යනු සම-ස්ථාන සත්කාරක, අතථ්‍ය සත්කාරක, වලාකුළු සත්කාරක සහ කැපවූ සත්කාරක වේ. මෙම දත්ත අඩාල නොවන බවට වග බලා ගැනීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට පැවරේ.

iii ශ්‍රී ලංකා ටෙලිකොම්හි ජංගම දුරකථන අංශය වන මොබිටෙල් යනු රජය සතු එකම ජංගම දුරකථන සන්නිවේදන සමාගමයි. ඩයලොග්, එයාර්ටෙල් , ලංකා බෙල් හා හච් ආදී අනෙකුත් සියලුම සේවා විදේශ සමාගම් සතුය. මොබිටෙල් ආයතනය වෙළඳපල තරඟකාරිත්වය සහතික කරයි.

## 7. BT සමූහයෙන් උගත හැකි පාඩම්

i.විදුලි සංදේශ සේවා පුද්ගලීකරණය කිරීමේදී ජාතික ආරක්‍ෂාව අනතුරේ හෙළීම සම්බන්ධ එක් මූලික උදාහරණයක් වන්නේ බ්‍රිටිෂ් ටෙලිකොමියුනිකේෂන් සමූහයෙහි සිද්ධියයි. 1980 ගණන්වල අග භාගයේදී බ්‍රිතාන්‍ය විදුලි සංදේශය පෞද්ගලීකරණය කරන ලද අතර රජය එහි කොටස් පුද්ගලික ආයෝජකයින්ට විකුණා දැමූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස, රටේ තීරණාත්මක ටෙලිකොම් යටිතල පහසුකම් හිමි කරගෙන පාලනය කිරීම පුද්ගලික ආයතනයක් සතු විය.

ii 2016 දී, එක්සත් රාජධානියේ රජය රටේ විදුලි සංදේශ ජාලය බ්‍රිටිෂ් ටෙලිකොමියුනිකේෂන් සමූහයේ හිමිකාරිත්වයට පත් වීම නිසා ඇති විය හැකි ආරක්ෂක අවදානම් ගැන සැලකිලිමත් විය. ජාතික ආරක්‍ෂාව සයිබර් ප්‍රහාර/ඔත්තු බැලීම් ආදියට ගොදුරු වී ඇති බවත් ද්වේෂසහගත ක්‍රියාකාරීන්ට ජාලය වැරදි සහගත ලෙස යොදා ගැනීම පහසු වී ඇති බවත් රජය තේරුම් ගත්තේය. බ්‍රිතාන්‍ය රජය පසුව සමාගමේ හිමිකාරිත්වය මගින් ජාතික ආරක්‍ෂාවට එල්ල වන තර්ජනය අවම කිරීම සඳහා බ්‍රිටිෂ් ටෙලිකොමියුනිකේෂන් සමූහය සඳහා දැඩි රෙගුලාසි පනවන ලදී. වර්තමානයේ බ්‍රිටිෂ් ටෙලිකොමියුනිකේෂන් සමූහය බ්‍රිතාන්‍ය පුරවැසියන්ගේ සන්නිවේදනය හසුරුවන නමුත් ජර්මනිය, ප්‍රංශය සහ නෝර්වේ සමඟ සම්බන්ධ වී ඇති සමාගම් කිහිපයකට අයත් වේ. ජාතික විදුලි සංදේශ සමාගමක් පෞද්ගලීකරණය කිරීමේ ප්‍රතිවිපාක මෙයින් පැහැදිලි වේ.

## 8. නිර්දේශ

i. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය දැනටමත් අර්ධ වශයෙන් පෞද්ගලීකරණය කර ඇති අතර ජාත්‍යන්තර සමාගම් සතුව කොටස්වලින් 44.98% ක් ද රජයට කොටස් 49.5% ක් ද ඇත. තවදුරටත් පුද්ගලීකරණය කිරීම මගින් රටෙහි තීරණාත්මක සන්නිවේදන යටිතල පහසුකම් / සංවේදී තොරතුරු, ලාභය ඉලක්ක කරගත් අභිලාෂයන් සහිත ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි පුද්ගලික ආයතන වෙත නිරාවරණය කරනු ඇත. **එබැවින් ටෙලිකොම් ආයතනය පෞද්ගලීකරණය නිර්දේශ නොකරයි.**

ii ත්‍රස්තවාදීන්ට/අන්තවාදීන්ට කුමන ආකාරයකින් හෝ /උපකාර කළ කිසිවකුට/අසාදු ලේඛනගත කර සංවිධානයකට කිසිදු කොටසක් මිලදී ගැනීමට සහ අපගේ ජාතික වත්කම් පාලනය කිරීමට **ඉඩ නොදිය යුතුය.**

iii. ගිවිසුමේ විධිවිධාන සලසා ඇති පරිදි රජයට ටෙලිකොම්හි අනෙකුත් විශාල කොටස් හිමියා සතු කොටස් ආපසු මිලදී ගත හැකි අතර, එම කොටස් සංවේදී සහ අවදානමට ලක්විය හැකි, අතිරික්ත ඉඩම් සහ ගොඩනැගිලි, තීරණාත්මක යටිතල පහසුකම් සහ ව්‍යාපාර ලෙස බෙදා දැක්විය හැකිය. ජාතික ආරක්‍ෂාවට බලපාන පළමු කොටස් රඳවා තබා ගනිමින්, තීරණාත්මක යටිතල පහසුකම් ආරක්‍ෂා කිරීම සහ සියලුම රජයේ රෙගුලාසි පිළිපැදීම සහතික කිරීම සඳහා, **පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය** හරහා ප්‍රධාන කොටස් හිමියන්ගේ අනෙකුත් කොටස් රජයට ඉවත් කළ හැකිය. මේ ආකාරයෙන් රජය ලාභ ලබන අතර ජාතික ආරක්ෂාව සහතික කරමින් ව්‍යාපාර කිරීමෙන් ඉවත් විය හැකිය.